# පාස්කු සතියේ
# සිකුරාදා

## පළමුවන දේව ප්‍රකාශනය

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් කොටසකි. ක්‍රියා 4 : 1 – 12

අපේ ගැළවීම සලසා දෙන අන් කිසි නමක් මුළු ලොවේ නොමැත.

පේදුරු තුමා සහ ජොහාන් තුමා සෙනඟට කතා කරමින් සිටියදී, පූජකයෝ ද දේව මාළිගාවේ මුර සෙබළුන්ගේ ප්‍රධානියා ද සද්දුසිවරු ද ඔවුන් අබිමුවට කඩා වැදුණාහ. ඔවුන් සෙනඟට අනුශාසනා කළ නිසා ද ජේසුස් වහන්සේගේ උත්ථානය මගින් පුනරුජ්ජීවනය ඇති වන බව ප්‍රකාශ කළ නිසා ද ඔව්හු අතිශයින් උදහස් වූහ. ඔව්හු ඔවුන් අත්අඩංගුවට ගෙන, සවස් වී තිබුණු බැවින් පසු දා වනතුරු හිර අඩස්සියේ තැබූහ. එහෙත් පණිවුඩය ඇසූ බොහෝ දෙනෙක් අදහා ගත්හ. ඒ පිරිමින්ගේ ගණන පන්දහසක් පමණ විය. පසුවදා ඔවුන්ගේ ප්‍රධානීහු ද ප්‍රජා මූලිකයෝ ද විනයධරයෝ ද යන මොවුහු උත්තම පූජක අන්නස් ද කයිපාස් ද ජොහාන් ද ඇලෙක්සන්දර් ද ඇතුළු උත්තම පූජක පරපුරට අයිති සියලු දෙනා ද සමඟ ජෙරුසලමේ රැස් වූහ. ඔව්හු ප්‍රේරිතවරුන් දෙදෙනා සභාව මැද සිටුවා, "ඔබ කුමන බලයකින්, කවරෙකුගේ නාමයෙන් මෙය කළහු දැ"යි විචාළහ. එවිට පේදුරු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ ව ඔවුන් අමතා මෙසේ කීය. "ප්‍රධානියෙනි, ප්‍රජා මූලිකයෙනි, කොර මිනිසෙකුට කරන ලද කාරුණික ක්‍රියාව ගැන හා ඔහු සුවපත් කරන ලද්දේ කෙසේද යන්න ගැන හා අද අපි විමසනු ලබමු නම්, එයට අපේ පිළිතුර මෙසේය. ඔබ විසින් කුරුසියේ ඇණ ගසන ලද්දා වූ ද දෙවියන් වහන්සේ විසින් උත්ථාන කරන ලද්දා වූ ද නාසරෙත්හි ජේසුස් වහන්සේගේ අනුහසින් ඔබ ඉදිරියේ මේ මිනිසා සුව සම්පන්නව සිටියි. ඒ බව ඔබ සියලු දෙනාත්, මුළු ඉශ්රායෙල් ජනයාත් දැන ගනිත්වා. උන් වහන්සේ වනාහි 'ගෘහ ශිල්පීන් වන ඔබ විසින් ප්‍රතික්ෂේප කරන ලද ගල ය. එහෙත් උන් වහන්සේම ප්‍රධාන ගල වූ සේක.' අන් කිසිවෙකු මගින් ගැලවීමක් නැත. මන්ද, අපේ ගැලවීම සලසා දෙන ලද අන් කිසි නාමයක් මුළු ලොවෙහිම මිනිසුන් අතර නැත."

දේව වචනය මෙසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 118 : 1-2, 4, 22-27

පිළිතුර: ගෘහ ශිල්පීන් ඉවත ලූ ගල ම මුල් ගල වී ඇත.
ආලේලූයා //

ගීය:

සමිඳුන්ට ස්තුති කරන්න. මන්ද, එතුමාණෝ යහපත් ය. එතුමන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේය.
"එතුමන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේ ය" යි ඉශ්රායෙල් දැන් කියත්වා!
"සමිඳුන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේ ය"යි එතුමන් කෙරෙහි ගරුබිය ඇත්තෝ දැන් කියත්වා!

ගෘහ ශිල්පීන් ඉවත ලූ ගල ම මුල් ගල වී ඇත. මෙය සමිඳුන්ගේ ක්‍රියාවකි. එය අපේ දෙනෙතට අසිරිමත් ය. මෙන්න, සමිඳුන්ගේ ජය මංගල දිනය! මෙදින අපි ප්‍රීති වෙමු. සන්තෝෂ වෙමු.
සමිඳුනි දැන් අප ගැලෙවුව මැනව. සමිඳුනි දැන් අපට ජය අත්කර දුන මැනව.

සමිඳුන්ගේ නාමයෙන් වඩින තැනැත්තේ ආසිරි ලද්දෙකි. සමිඳුන්ගේ මාලිගාවේ සිට අපි ඔබට ආසිරි පතමු.
සමිඳාණෝ දෙවිඳාණෝය. එතුමාණෝ අපට එළිය දුන් සේක. ගොක් අතු ගත් අත් ඇතිව පූජාසනය වටා පෙරහරින් ගමන් කරන්න.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!

මෙන්න සමිඳුන්ගේ ජය මංගල දිනය! මෙදින අපි ප්‍රීති වෙමු. සන්තෝෂ වෙමු.

ආලේලූයා!

# සුවිශේෂය

ජොහාන් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි. ජුවාම් 21 : 1 – 14

උන්වහන්සේ පූප රැගෙන ඔවුන්ට දුන් සේක. එසේම මසුන් ද දුන් සේක.

ඉන්පසු ජේසුස් වහන්සේ තිබේරියස් නම් මුහුද ළග දී ශ්‍රාවකයන්ට නැවත දර්ශනය වූ සේක. උන්වහන්සේ දර්ශනය වූයේ මේ අයුරින් ය. සීමොන් පේදුරු ද 'නිවුන් දරුවා' නම් වූ තෝමස් ද ගලීලයේ කානාහි නතානියෙල් ද සෙබදීගේ පුත්‍රයෝ ද උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් තවත් දෙදෙනෙක් ද එක්ව සිටියෝය. සීමොන් පේදුරු "මම මසුන් අල්ලන්න යමි" යි ඔවුන්ට කීය. "අපිත් ඔබ සමග එමු"යි ඔව්හු ඔහුට කීහ. ඔව්හු පිටත්ව ගොස් ඔරුවට නැංගාහ. එහෙත් ඒ රාත්‍රියේ ඔවුන් කිසිවක් ඇල්ලුවේ නැත. පහන් වූ කල ජේසුස් වහන්සේ වෙරළෙහි සිටි සේක. එසේ වුවත්, ඒ ජේසුස් වහන්සේ බව ශ්‍රාවකයෝ නොදත්හ. එවිට ජේසුස් වහන්සේ "මිත්‍රවරු, ඔබ ළග මාළු තිබේ දැ"යි ඔවුන්ගෙන් ඇසූ සේක. ඔව්හු "නැතැ" යි කීහ. උන් වහන්සේ ඔවුන් අමතමින් "ඔරුවේ දකුණු පැත්තෙන් දැල හෙළන්න. එවිට සම්බ වනු ඇතැ"යි වදාළ සේක. එසේ දැල හෙළූ කල අසුවූ මසුන් රාශිය නිසා දැල ඇද ගන්නට වත් ඔවුන්ට නොහැකි විය. ජේසුස් වහන්සේ ප්‍රේම කළ ශ්‍රාවකයා පේදුරුට කතා කොට, "අන්න ඒ සමිඳාණන් වහන්සේ ය"යි කීය. එවිට සීමොන් පේදුරු ද ඒ සමිඳාණන් වහන්සේ බව අසා, තමා ඉණ රෙද්ද ලිහා දමා සිටි බැවින් වහා එය ඇඳගෙන මුහුදට පැන්නේය. එහෙත් සෙසු ශ්‍රාවකයෝ මසුන්ගෙන් පිරුණු දැල ඇදගෙන කුඩා ඔරුවෙන් ආහ. ඔව්හු වෙරළට නුදුරුව මීටර් සියයක් පමණ ඈතින් සිටියහ. ඔව්හු ගොඩට ආ විට එහි ගිනි අගුරු ද ඒ පිට මාළු තිබෙන බව ද රොටි ද දුටුවෝය. "ඔබ දැන් ඇල්ලූ මසුන්ගෙන් ස්වල්පයක් ගෙනෙන්නැ"යි ජේසුස් වහන්සේ ඔවුන්ට වදාළ සේක. සීමොන් පේදුරු ඔරුවට නැගී ලොකු මසුන් එකසිය පණස්තුන් දෙනෙකුගෙන් පිරුණු දැල ගොඩට ඇද්දේය. එපමණ තිබුණ නමුත් දැල ඉරුණේ නැත. ජේසුස් වහන්සේ කතා කොට "එන්න, අනුභව කරන්නැ"යි ඔවුන්ට වදාළ සේක. ඒ සමිඳාණන් වහන්සේ බව ඔවුන් දැන හිටි හෙයින් "ඔබ කවරෙකුදැ"යි උන්වහන්සේගෙන් අසන්නට ශ්‍රාවකයන්ගෙන් කිසිවෙකුට වත් ධෛර්යය නොතිබිණි. ජේසුස් වහන්සේ ඇවිත් රොටි රැගෙන ඔවුන්ට දුන් සේක. එසේම මාළුත් දුන් සේක. මේ වනාහි ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ පසු ශ්‍රාවකයන්ට දර්ශනය වූ තුන් වන වතාවය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේය.